# පස්යොදුන් රට ස්තූප පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් (ඓතිහාසික යුගයේ සිට විසිවන සියවසේ මුල් භාගය දක්වා)

**සෙනෙවිරත්න ටී.කේ.ජී.**[1]

මිනිසාගේ යටගියාව අතීතයට අයත් ද්‍රව්‍යමය සාධක ඔස්සේ ගොඩනගන පුරාවිද්‍යාවට වාස්තුවිද්‍යාව එක්වෙද්දී වාස්තුවිද්‍යාවේ විපරම් ක්ෂේත්‍රය තවත් පුළුල් වී යයි. ස්තූප යනු වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම්වල අගනා නිර්මාණයකි. මහින්දාගමනයත් සමග ලංකාවේ ස්ථාපිත වූ මෙකී බෞද්ධාගමික සංස්කෘතිය විවිධ යුගවල දී රාජ්‍යත්වයට පත් වූ පාලකයන් විසින් ප්‍රයෝජනයට ගත් අවස්ථාවක් ලෙස අතීතයේ දී ඉදිකරන ලද දැවැන්ත ස්තූපයන් වන ථූපාරාමය, මිරිසවැටිය, රුවන්වැලිසෑය, අභයගිරිය වැනි ස්තූපයන් පෙන්වාදිය හැකි ය. මෙම ස්තූප පිළිබඳව බොහෝ විද්වතුන් විසින් නොයෙක් පර්යේෂණයන් සිදුකර තිබේ. ඒ අතරින් බොහෝ දෙනෙකුට අසන්නට දකින්නට නොලැබෙන පස්යොදුන් රට ස්තූප පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීම සඳහා ක්ෂේත්‍ර ගවේෂණය සිදු කරන ලදී. කලාපය පුරා ම පුරාතන ජනාවාස ව්‍යාප්තිය හා ආරාම ස්ථානගත වී ඇති බව දැකගැනීමට හැකි විය. ඒ අතරින් ඇති ස්තූපවලින් පැරණි ම ස්තූපය පොළොන්නරු යුගය නියෝජනය කළ අතර අනෙක් ස්තූප සමස්තයක් වශයෙන් ගත් කල දහඅට වන සියවසෙන් පසුව ඉදිකරන ලද නිර්මාණ බව තහවුරු විය. ඝණ්ටාකාර ආකෘතිය මෙම ප්‍රදේශයේ ස්තූපවල දක්නට ලැබෙන ප්‍රධාන සැලැස්මකි. ස්තූප නිර්මාණය කිරීම සඳහා දේශීය මෙන් ම විදේශීය ආභාසය ලැබී තිබේ. පස්යොදුන් රටට අයත් ස්තූපවල ඒවාට ආවේණික ඉදිකිරීම් ලක්ෂණ ප්‍රකට වන අතර ස්තූපයේ වේදිකාව, පේසාව, ගර්භය, හතරැස් කොටුව, දේවතා කොටුව හා කොත්කරැල්ල යන ස්ථානයන්හි ඉර, හඳ, නෙළුම් මල, ලියවැල, බෝපත්, පලාපෙති යනාදි වූ සිංහල සැරසිලි අලුත්ගම කන්දේ විහාරයේ ස්තූපය, අලුත්ගම කල්‍යාණාරාම පුරාණ විහාරයේ ස්තූපය, පයාගල පොතුවිල වෙහෙරගලකන්ද විහාරයේ ස්තූපය හා පයාගල ඇතගම සුමනාරාම විහාරයේ ස්තූපය, බෙල්ලන ශ්‍රී ධර්මපාල පිරිවෙනේ ස්තූපය වැනි ස්තූපවල දැකගත හැකි ය. තවද කඟවේනා වැනි බ්‍රිතාන්‍ය සංකේත බෙල්ලන ශ්‍රී ධර්මපාල පිරිවෙනේ පිහිටි ස්තූපයෙහි දක්නට ලැබෙන අතර ඒ අනුව පැහැදිලි වන්නේ බ්‍රිතාන්‍ය ආභාසය තදින් ම මෙම ප්‍රදේශයෙහි පැතිර ඇති බව යි. තවද කළුගල් නෙළීමේ තාක්ෂණය ඈත අතීතයේ සිට ම මෙම කලාපයේ පැවති බව කළුගල් භාවිතයෙන් ඉදිකර ඇති පොල්ගම්පල වික්‍රමශිලා පිරිවෙනේ ස්තූපය, කළුතර දූව විහාරයේ ස්තූපය, මීගහතැන්න විද්‍යාරාම පිරිවෙනේ ස්තූපය හා කළුගල ආරණ්‍ය සේනාසනයේ පිහිටි ස්තූපය වැනි ස්තූපයන්ගෙන් පෙනී යයි.

**මුඛ්‍ය පද :** වාස්තුවිද්‍යාව, ස්තූප, ඝණ්ටාකාර, පොළොන්නරු යුගය, කළුගල් නෙළීමේ තාක්ෂණය

[1] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. tkalpani9@gmail.com